අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/04/58/20/ජා.පා. SLEAS/ESC

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2022.01.20

**නම :-**

**සම්මුඛ පරීක්ෂණ අංකය :-**

**ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය II/ III ශ්‍රේණිය**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II/ III ශ්‍රේණියේ නිළධාරියෙකු විදුහල්පති ධුරය දැරිය යුතු ජාතික පාසල් 20 ක විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.**

**02.** **ඒ සඳහා ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 03 වන මහළ කමිටු ශාලාවට ................. දින පෙ.ව ............ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අදාළ සහතිකවල ඡායා පිටපත් (අංක I සිට VII දක්වා ලේඛන) ගොනුවක් පහත සඳහන් අනුපිළිවෙලට සකස් කර ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.**

I. **සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය**
II. **ජාතික හැඳුනුම්පත**
III. **නමෙහි වෙනසක් පවතී නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශය (නමෙහි වෙනසක් පවතී නම් පමණක්)**
IV. **සේවා පළපුරුද්ද සනාථ කිරීම සඳහා**
   a) **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ මුල් පත්වීම් ලිපිය**
   b) **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවය ස්ථිර කිරීමේ ලිපිය**
   c) **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස්වීමේ ලිපිය (II ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් පමණි)**
   d) **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත් වූ දින සිට 2021.10.12 දින දක්වා ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සේවය පිළිබඳ සහතිකය - ආකෘති පත්‍ර අංක 01**

V. **අධ්‍යාපන සුදුසුකම් - අනු අංක 02 යටතේ ද**

VI. **සේවා ඇගයීම අනු අංක 05 යටතේ**

VII. **අධ්‍යාපනයට අදාල පර්යේෂණ සහ ප්‍රකාශන අනු අංක 06 යටතේ ද**
   **a)** **අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු පටිපාටියේ අංක 6 යටතේ ඔබ විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අධ්‍යාපන පර්යේෂණ හා ප්‍රකාශන වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීමේදී එම පර්යේෂණ/ප්‍රකාශනය කුමක්ද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුව/පිටු එම ප්‍රකාශනයන් කෘති/ප්‍රකාශන ලෙස ඔබගේ නම සඳහන් වන පිටුව/පිටු වල සහතික කරන ලද පිටපත් සමඟ අදාල පර්යේෂණ හා ප්‍රකාශන වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය.**

**03.** ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනයන්හි දකුණු පස ඉහළ කෙළවර ලකුණු පටිපාටියේ කුමන අනු අංකය යටතේ ලකුණු ලබා ගැනීමට ඉදිරිපත් කරන්නේද යන්න සඳහන් කර තිබිය යුතුය.

උදා - අධ්‍යාපන සුදුසුකම් සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික - අනු අංක 02

ඒ අනුව ඡායා පිටපත් ගොනුව සැකසීමෙන් පසු මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර අංක 02 සම්පූර්ණ කර ගොනුව සමග සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. ප්‍රසිද්ධ කර ඇති ලකුණු පටිපාටියේ දක්වා ඇති 'සටහන්' කෙරෙහි මනා අවධානයෙන් යුක්තව ලේඛන ඉදිරිපත් කල යුතුය

**04.** මෙම සම්මුඛ පරීක්ෂණයේදී ඔබ දක්වනු ලබන කාර්ය සාධනය හා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව උපයාගනු ලබන ලකුණු මත ලබා ගන්නා සමස්ථ කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව පමණක් විදුහල්පති තනතුරු පුරප්පාඩු වී ඇති ජාතික පාසල් විදුහල්පති තනතුරකට පත් කරනු ලැබීම සිදු වේ.

**05.** අයදුම්කරුවන් අදාළ අයදුම්පත්‍රයේ මනාපය පළකරන ලද ඕනෑම ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත්වීම් ලදහොත් අනිවාර්යයෙන්ම එම තනතුරෙහි රාජකාරී භාරගත යුතු බවත්, පසුව අයදුම්පත්‍රයේ මනාපය වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා නොලබන බවත් වැඩිදුරටත් දන්වමි.

**06.** සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පමණක් පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොවන බව ද, දැනට පුරප්පාඩු වී ඇති ජාතික පාසල් විදුහල්පති තනතුරු සියල්ල සඳහාම නිලධාරීන් පත් කිරීමේ හෝ තනතුරු කිහිපයක් සඳහා පමණක් නිලධාරීන් පත් කිරීමේ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වන බව ද, වැඩිදුරටත් අවධාරණය කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමර
අතිරේක ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

අවධානයට: ඔබ නියමිත දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්යය බව ද සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමේදී ඉහත සඳහන් ලිපි ලේඛන සියල්ලම නිවැරදි ලෙස රැගෙන පැමිණිය යුතු බවද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙන් පසුව කිසිදු හේතුවක් මත කිසිදු ලේඛනයක් සුදුසුකම් සනාථ කිරීම සඳහා භාර නොගන්නා බව ද තවදුරටත් අවධාරණය කරමි.